# 6

# රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ රාජ්‍ය මූල්‍ය කටයුතු

රජයේ අයවැය මෙහෙයුම් කටයුතුවල මිශ්‍ර කාර්යසාධනයක් 2018 වසරේ පළමු මාස අට තුළදී පෙන්නුම් කළේය. ආදායම් රැස් කිරීමෙහිලා සැලකිය යුතු පහළ වැටීමක් පැවතිය ද සමහර ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්හි සිදු වූ වැඩිදියුණුවීම තුළින් රාජ්‍ය මූල්‍ය අංශයේ මිශ්‍ර කාර්යසාධනය නිරූපනය විය. විශේෂයෙන්ම, ආනයන තීරු බදු සහ සෙස් බදු වලින් රැස් කළ බදු ආදායම පහළ වැටීම හේතුවෙන් රජයේ ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මෙම කාලපරිච්ඡේදයේදී 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 9.0 සිට සියයට 8.6 දක්වා අඩු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ද ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 13.0 ට සාපේක්ෂව සියයට 12.1 ක් දක්වා අඩු වූ අතර, පුනරාවර්තන වියදම මෙන්ම රාජ්‍ය ආයෝජන ද අඩුවීම මේ සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන්ම, සහනාධාර, පැවරුම් සහ වැටුප් හා වේතන මත සිදු කළ වියදම අඩුවීම හේතුවෙන් පුනරාවර්තන වියදම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මෙම කාලය තුළ දී අඩු විය. යටිතල පහසුකම් ව්‍යාපෘති මන්දගාමී ලෙස ක්‍රියාත්මක වීම හේතුවෙන් රාජ්‍ය අයෝජන ද අඩු විය. ආදායම් රැස් කිරීම අඩු මට්ටමක පැවතිය ද ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශකවල දැකිය හැකි වූ සාධනීය තත්ත්වයන් මගින් වියදම්වල පහළ යෑම පෙන්නුම් කළේය. ඒ අනුව, රාජ්‍ය ආදායමේ අඩුවීමට වඩා රාජ්‍ය වියදම අඩුවීම හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 4.0 සිට සියයට 3.5 දක්වා අඩු විය. ආදායම සහ පොලී නොවන වියදම් අතර පරතරය පිළිබිඹු කෙරෙන ප්‍රාථමික ගිණුම, මෙම කාලය තුළ ඇස්මේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.4 (රුපියල් බිලියන 57.6) ක අතිරික්තයක් වාර්තා කරනු ලැබීය. මේ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ ප්‍රමාණාත්මක කාර්යසාධන ඉලක්කයක් වන ප්‍රාථමික ගිණුමේ ශේෂය සම්බන්ධ ඉලක්කය ද රජය විසින් සපුරාලන ලදී. කෙසේ වෙතත්, රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙමින්, ආදායම සහ වර්තන වියදම අතර පරතරය දක්වන වර්තන ගිණුමේ ශේෂය, 2018 වසරේ පළමු මාස අට තුළදී ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වූ සියයට 0.9 සිට සියයට 1.0 දක්වා වැඩි විය. සමස්ත අයවැය හිඟය මූල්‍යනය කිරීමේදී විදේශීය මූලාශ්‍ර මත විශාල වශයෙන් රඳා පැවතීමට සිදු විය. දේශීය වශයෙන් මූල්‍යනය කිරීමේදී බැංකු අංශයෙන් සිදු කළ ශුද්ධ මූල්‍යනය මෙම කාලය තුළ ශුද්ධ ආපසු ගෙවීමක් ලෙස වාර්තා වූ අතර, බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය සැලකිය යුතු ලෙස වැඩි විය. 2018 වසරේ පළමු මාස අට තුළදී සමහර රාජ්‍ය මූල්‍ය දර්ශක වැඩිදියුණු වූ කාර්යසාධනයක් පෙන්නුම් කළ ද, අපේක්ෂිත ඉලක්ක අත්පත් කර ගැනීම සඳහා පූර්වෝපායී ක්‍රියාමාර්ග නොගන්නේ නම්, 2018 අයවැයෙහි සඳහන් රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීම අභියෝගාත්මක වනු ඇත. ආනයන තීරු බදු සහ සෙස් බදු වලින් ලැබෙන අඩු ආදායම, මුදල් පනත සඳහා සංශෝධන සිදු කිරීම වැනි ආදායම ඉහළ නංවා ගැනීමේ සමහරක් පියවර ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම යනාදිය හේතුවෙන් අයවැයෙහි සඳහන් ආදායම් ඉලක්කවලින් රාජ්‍ය ආදායම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු වීමට ඉඩ ඇත. වියදම් අංශය ගත් විට, රාජ්‍ය ආයෝජනවල අඩුවීම, ආර්ථික වර්ධනයට සහ රටෙහි සංවර්ධනය කෙරෙහි ඍණාත්මක ලෙස බලපානු ඇත. ඒ අනුව, රාජ්‍ය මූල්‍ය අංශයේ අසමබරතාව රටෙහි සමස්ත සාර්ව ආර්ථික ස්ථායිතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින්, ඉදිරියේදී මැතිවරණ පැවැත්වීමට නියමිත වාතාවරණයක් යටතේ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඉලක්ක අත්පත් කර ගැනීම කරා ළඟා වීම උදෙසා රජයේ ශක්තිමත් කැපවීම මූලික අවශ්‍යතාවයක් වේ.

## රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

- **අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 ක් සහ නොපියවූ රාජ්‍ය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 70.0 ක් දක්වා මැදිකාලීනව අඩු කර ගැනීමේ අරමුණින් යුතුව ආදායම් පාදක කර ගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය 2018 වසරේදී ද රජය විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** මෙම මැදිකාලීන අරමුණුවලට සමගාමීව, රාජ්‍ය ආදායම වැඩි කර ගැනීමට සහ රාජ්‍ය වියදම් තාර්කීකරණය කිරීමට මෙන්ම රාජ්‍ය ණයෙහි තිරසාරභාවය තහවුරු කර ගැනීමට අදාළව රජය විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. පවත්නා බදු පද්ධතිය සරල කිරීම සහ බදු පදනම පුළුල් කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගණනාවක් 2018 අයවැය මගින් යෝජනා කරන ලද අතර, බදු පරිපාලනය සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන ලදී. මෙම යෝජනාවලින් සමහරක් 2018 වසරේ මුල් මාස අට තුළදී ක්‍රියාවට නංවන ලදී. එයට අමතරව, රජයේ වියදම ප්‍රමුඛතා පදනම මත ක්‍රියාත්මක කිරීමට සහ තාර්කීකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලද අතර, රාජ්‍ය වියදම නියමිත මට්ටමෙහි පවත්වා ගැනීම සඳහා කාර්තුමය රාජ්‍ය මූල්‍ය ඉලක්ක හඳුන්වා දෙන ලදී. අනෙකුත් ක්‍රියාමාර්ග සැලකීමේදී, මැදිකාලීනව ණය කළමනාකරණ උපායමාර්ග වැඩිදියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා 2018 අංක 8 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත වැනි නීතිමය ක්‍රියාමාර්ග ද හඳුන්වා දෙන ලදී. එවැනි මැදිකාලීන ඉලක්ක වෙත ගමන් කිරීම පිණිස, 2018 වසර සඳහා වන අයවැය මගින් ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිඟය 2017 වසරේ පැවති සියයට 5.5 සිට සියයට 4.8 දක්වා වූ ශීඝ්‍ර අඩුවීමක් රජය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම වර්ධනයට සමගාමීව 2018 වසර අග වන විට වර්තන ගිණුමේ අතිරික්තය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.5 ක් ලෙස ද ප්‍රාථමික ගිණුමේ අතිරික්තය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.0 ක් ලෙස ද පවත්වා ගැනීමට අපේක්ෂිතය.

- **2018 අප්‍රේල් 01 දින සිට බලාත්මක වූ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත මගින් පවතින ආදායම් බදු ව්‍යුහය සරල හා තාර්කීකරණය කිරීම, සෘජු බදු පදනම පුළුල් කිරීම සහ පරිපාලන බලතල ශක්තිමත් කරමින් අන්තර්ජාතික විශිෂ්ට පරිචයන් ශ්‍රී ලංකාවේ බදු පද්ධතියට හඳුන්වා දෙන ලද අතර, රජයේ ආදායම් ඉහළ නංවාගැනීමේ උත්සාහයන් සඳහා සහාය විය.** තනි පුද්ගල ආදායම් බදු නිදහස් සීමාව කලින් පැවති රුපියල් 500,000 මට්ටමේ නොවෙනස්ව පවතින නමුත් සේවා නියුක්ති ආදායමෙන් ලැබෙන වාර්ෂික බදු නිදහස් සීමාව රුපියල් 750,000 සිට රුපියල් මිලියන 1.2 දක්වා ඉහළ නංවන ලදී. තවද, සේවා නියුක්ති ආදායම ඇතුළුව තනි පුද්ගල ආදායම් බදු සඳහා වන බදු කාණ්ඩ රුපියල් 600,000 දක්වා රුපියල් 100,000 කින් පුළුල් කරන ලද අතර, උපරිම ආන්තික බදු අනුපාතිකය සියයට 16 සිට සියයට 24 දක්වා වැඩි කරන ලදී. එයට අමතරව, නව පනත මගින් සංස්ථාපිත ආදායම් බදු ව්‍යුහය විධිමත් කළ අතර, ස්ථර තුනකින් යුතු බදු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී. එනම්; මත්පැන්, දුම්කොළ, ඔට්ටු හා සූදු ව්‍යාපාර සඳහා සියයට 40 ක බදු අනුපාතිකයක් ද, බැංකු, මූල්‍ය ව්‍යාපාර, රක්ෂණ කර්මාන්ත සහ වෙළඳ කටයුතු සඳහා සියයට 28 ක සම්මත බදු අනුපාතිකයක් සහ අනෙක් සියලු අංශ සඳහා සියයට 14 ක බදු අනුපාතිකයක් හඳුන්වා දෙන ලදී. තවද, ප්‍රාග්ධන වත්කම් විකිණීමේදී ලැබෙන ලාභය මත සියයට 10 ක ප්‍රාග්ධන ලාභ බද්දක් හඳුන්වා දෙන ලද අතර, නේවාසික පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතු මගින් උපයන පොලී ආදායම මත අය කෙරෙන රඳවා ගැනීමේ බදු අනුපාතිකය සියයට 2.5 සිට සියයට 5 දක්වා වැඩි කරන ලදී. කෙසේ වෙතත්, ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ බැංකු තැන්පතු මගින් ලැබෙන පොලී ආදායම සඳහා වසරකට රුපියල් මිලියන 1.5 ක් දක්වා රඳවා ගැනීමේ බදු නිදහස් කිරීමක් ලබා දෙන ලදී. තවද, 2018 අප්‍රේල් මාසයේදී නව බදු අත්පොතක් ප්‍රකාශයට පත් කරන ලද අතර, නව පනත පිළිබඳව බදු ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ සහ පොදු ජනතාවගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සඳහා පුහුණු සැසි ද පවත්වනු ලැබීය.

- **පාරිභෝගික භාණ්ඩ කිහිපයක දේශීය සැපයුම සහ ඇතැම් අන්තර්ජාතික මිල ගණන්වලට සමගාමීව එම ද්‍රව්‍යවල දේශීය මිල ගණන් ස්ථාවරව පවත්වා ගැනීම සඳහා වසර තුළදී ආනයන බදු සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මත සංශෝධන කිහිපයක් සිදු කරන ලදී.** ඒ අනුව, රත්‍රන් ආනයනය සහ රත්‍රන් වංචනිකව රටින් පිටතට රැගෙන යෑම අධෛර්යමත් කිරීමේ අරමුණින් 2018 අප්‍රේල් මාසයේදී රත්‍රන් ආනයනය මත සියයට 15 ක ආනයන තීරු බද්දක් පනවන ලදී. 2018 මැයි 11 වැනි දින ඉන්ධන සඳහා මිල සූත්‍රය හඳුන්වාදීමත් සමග පෙට්‍රල් සහ ඩීසල් ආනයන මත වූ ආනයන තීරු බදු සහ ආනයන තීරු බදු අත්හැරීම සංශෝධනය

කරන ලදී. ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්) ආනයන මත වූ ආනයන බදු සහ ආනයන තීරු බදු අත්හැරීම් පිළිවෙළින් ලීටරයට රුපියල් 25.42 ක් සහ ලීටරයට රුපියල් 7 ක් විය. ඊට සමගාමීව, සුදු ඩීසල් සඳහා ආනයන බදු සහ ආනයන තීරු බදු අත්හැරීම පිළිවෙළින් ලීටරයට රුපියල් 5.85 ක් සහ ලීටරයට රුපියල් 2 ක් විය. තවද, එතෙක් පැවති තීරු බදු අත්හැරීම් ඉවත් කිරීමත් සමඟ පෙට්‍රල් (95 ඔක්ටේන්) සහ සුපිරි ඩීසල් සඳහා වූ ආනයන බදු පිළිවෙළින් ලීටරයට රුපියල් 25.59 සහ ලීටරයට රුපියල් 10.55 දක්වා අඩු කරන ලදී. මේ අතර, පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හඳුන්වා දුන් අතර, අර්තාපල්, බොම්බයි ළූනු, උඳු සහ පරිප්පු මත වූ ආනයන බදු වසර තුළදී වැඩි කරන ලදී.

- **ආදායම් රැස් කිරීම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව බදු පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ආරම්භ කරන ලදී.** ඒ අනුව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි අන්තර්ගත විධිවිධාන ඇතුළත් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කර ඇති ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කෙරෙමින් පවතී. තවද, බදු පරිපාලනය නවීකරණය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ආයතනික සහ ව්‍යාපාර පටිපාටි ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. ආයතනික ක්‍රියාකාරකම්වලට අදාළව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීම, සැලසුම් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ අංශයක් පිහිටුවීම, බදු ගෙවන්නන් සමග ගනුදෙනු කිරීම වේගවත් කිරීම සඳහා කළමනාකරණ ව්‍යුහය වඩා කාර්යක්ෂම කිරීම, මහා පරිමාණ බදු ගෙවන්නන්ගේ අංශය ශක්තිමත් කිරීම, අත්‍යවශ්‍ය ඊ සේවාවන් ගොනුගත කිරීම (e filling) අනිවාර්ය කිරීම සහ බදු ගෙවන්නන් හඳුනා ගැනීමේ අංක භාවිතය ඉහළ නැංවීම යනාදිය මෙම ප්‍රතිසංස්කරණවලට අයත් වේ. මේ අතර, ආනයනකරුවන්ට සහ අපනයනකරුවන්ට පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ජාතික තනි ප්‍රවේශ පද්ධතියක් ස්ථාපිත කිරීමට පියවර ගෙන ඇත. මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි පිහිටුවා ඇති ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය මගින් ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය නවීකරණය කිරීමට සහාය වේ. ඒ අනුව, 2019 අයවැය සකස් කිරීමේ කටයුතු සඳහා ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය ප්‍රාථමික පද්ධතිය ලෙස යොදා ගන්නා ලද අතර, රාජ්‍ය නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා දිවයින පුරා දැනුම්වත් කිරීමේ වැඩමුළු ක්‍රියාත්මක කරන ලදී. 2006 වසර සිට 2017 වසර දක්වා වන අතීත දත්ත නිරවුල් කර ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතියට ඇතුළත් කර ඇති අතර, තෝරා ගත් රාජ්‍ය ආයතන සමග ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතියේ ඇති අන්තර්මුහුණත් සම්පූර්ණ කිරීම සහ පරීක්ෂා කිරීම සිදු කර ඇත.

- **වියදම් අංශය සැලකීමේදී, රාජ්‍ය මූල්‍ය ඉලක්ක වෙතින් අපගමනය වීම අවම කිරීම සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් හඳුන්වා දෙන ලදී.** ඒ අනුව, රාජ්‍ය මූල්‍ය පාලනය කිරීමට පාර්ලිමේන්තුවට ඇති හැකියාව ශක්තිමත් කිරීම සඳහා 2017 අයවැය මගින් ප්‍රකාශයට පත් කළ පරිදි, 2018 වසරේ පළමු කාර්තුව සඳහා වන වියදම් සහ ආදායම් කාර්යසාධනය පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවට අනුව, 2018 වසරේ පළමු කාර්තුවෙහි ආදායම් සහ වියදම් කාර්යසාධනය ඉලක්කගත මට්ටමට වඩා අඩු අගයක පැවතුණි. රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 අනුව, වාර්ෂික අයවැය ප්‍රතිපාදන විධිමත් ලෙස උපයෝජනය කිරීම සහතික කිරීමේ අරමුණින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු 2018 වර්ෂය සඳහා කාර්තුමය පදනමින් සකස් කිරීම සඳහා වියදම් සිදු කරන සියලුම ආයතනවලට උපදෙස් ලබා දෙන ලදී. තවද, ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2018 අනුව, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය ආයතනවල මෝටර් රථ ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. තවද, රජයේ බහුකාර්ය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා භාවිතයට ගැනීම පිණිස සංවර්ධන ව්‍යාපෘතීන්හි සියලුම තොරතුරු අන්තර්ගත කරමින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් බහුකාර්ය දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. මෙමගින් නිවැරදි සහ යාවත්කාලීන තොරතුරු සැපයෙන බැවින් වඩාත් යෝග්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියකට එයින් පහසුකම් සැලසෙයි. මීට අමතරව, නායයෑම් සහ ගංවතුර වැනි හදිසි අවස්ථාවන්හි කඩිනම් ප්‍රතිචාර දැක්වීමට ද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයට එමගින් හැකියාව ලබා දෙයි.

- **විශ්‍රාම වැටුප් ගෙවීම් ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරන අතර, විශ්‍රාම වැටුප් ගෙවීම් සම්බන්ධ සේවා සැපයීම වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වාදෙන ලදී.** රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2018 අනුව, විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. ඒ අනුව, විශාල ආයතනවල විශ්‍රාම වැටුප් අංශයක් පිහිටුවීමට සහ විශ්‍රාම යාමට ආසන්න නිලධාරීන්ගේ දත්ත පද්ධතියක් මේ වන විට සකස් කර නොමැති රාජ්‍ය ආයතන සඳහා එය සකස් කිරීමට උපදෙස් ලබා දෙන ලදී. තවද, විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 09/2015 (සංශෝධන III) අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ස්වයංක්‍රීයකරණය කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා 2018 ජූනි 01 දින සිට බලපැවැත්වෙන පරිදි මරණ පාරිතෝෂික ගෙවීම් අන්තර්ජාලය ඔස්සේ ලබා දීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. එසේම, 2018 ජූනි 30 දින සිට බලපැවැත්වෙන පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් සඳහා වන අයදුම්පත් අන්තර්ජාලය ඔස්සේ යොමු කළ හැකි ක්‍රමයක් හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 08/2018 අනුව, ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන හෝ නොදරන රජයේ නිලධාරියෙකු, අනතුරුදායක රැකියාවක නිරත වීමේදී හෝ තනතුරට පැවරී ඇති රාජකාරි ඉටු කිරීමේදී හෝ වැළඳෙන රෝග හේතුවෙන් මරණයට පත්වුවහොත්, එම නිලධාරියාගේ යැපෙන්නන් හට වන්දි ගෙවීමට තීරණය කරන ලදී.


- **සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ වුවද, රජය 2018 වසරේ පළමු මාස අට තුළදී රාජ්‍ය ආයෝජන වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.** ඒ අනුව, ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීමේ සහ රථ වාහන තදබදය අඩු කිරීමේ අරමුණින් යුතුව වසරේ පළමු මාස අට තුළදී මාර්ග ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉඩම් අත්පත් කර ගැනීම සඳහා රජය විසින් ආයෝජනය කරන ලදී. උතුරු, උතුරු මැද, වයඹ, මධ්‍යම සහ නැගෙනහිර පළාත්වල කෘෂිකාර්මික කටයුතුවලට පහසුකම් සැලසීමේ අරමුණින් මොරගහකන්ද බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය[1] 2018 ජනවාරි මසදී ජනතා අයිතියට පත් කළ අතර, 2018 ජූලි මසදී කළු ගඟ ජලාශයට ජලය පිරවීමේ කටයුතු ආරම්භ කරන ලදී. 2018 වසරේ පළමු මාස අට තුළදී අධ්‍යාපන ක්ෂේත්‍රයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම, "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ මානව සම්පත් හා භෞතික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම කෙරෙහි යොමු වූ අතර ගංවතුර හා නායයෑම් මගින් හානියට පත් වූ පාසල් ප්‍රතිසංස්කරණය කරන ලදී. මේ අතර, වසරේ පළමු මාස අට තුළදී කුරුණෑගල සහ පොළොන්නරුව ප්‍රදේශවල නව ජාතික පාසල් දෙකක ඉදිකිරීමේ කටයුතු ආරම්භ විය. එසේම රටේ යටිතල පහසුකම් අවශ්‍යතාව සපුරාලමින් රාජ්‍ය අයෝජන සිදු කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය ජාතික උපායමාර්ගයක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව සඳහා වන ජාතික නියෝජිතායතනය විසින් පනතක් කෙටුම්පත් කරමින් පවතින අතර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ උපදේශනය යටතේ රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ සමාලෝචනය සහ ඒවා සකස් කර අවසන් කිරීමේ කටයුතුවල නිරත විය.

- **රජය විසින් සාමාජීය වශයෙන් ශක්තිමත් නොවන, අවධානය ලැබිය යුතු කණ්ඩායම් සඳහා සුභසාධන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතර, සහනාධාර වැඩසටහන් තාර්කීකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය.** සමෘද්ධි වැඩසටහන, පොහොර සහනාධාර වැඩසටහන, වයස අවුරුදු 70 ට වැඩි පුද්ගලයින් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම, අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම, වකුගඩු රෝගීන් සඳහා මූල්‍යමය ආධාර ලබා දීම, පෝෂණීය ආහාර ලබාදීමේ වැඩසටහන, ශිෂ්‍යයන් සඳහා නොමිලේ පෙළපොත් සහ වාර ප්‍රවේශ පත්‍ර ලබා දීම ශ්‍රී ලංකාවේ ප්‍රධාන සුභසාධන වැඩසටහන් වේ. මාතෘ සහ ළමා පෝෂණය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව ගර්භනී මව්වරුන්ට පෝෂණීය ආහාර මල්ලක් ලබා දීම, ත්‍රිපෝෂ වැඩසටහන සහ පාසල් පෝෂණ වැඩසටහන වැනි වැඩසටහන් වසරේ පළමු මාස අට තුළදී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සුභසාධන ප්‍රතිලාභ වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරම ජීවන තත්ත්වය නගා සිටුවීම සඳහා ආදර්ශ ගම්මාන පනහක් ස්ථාපිත කිරීමට අපේක්ෂිතය. ඒ අනුව, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීමට සුදුසු ස්ථාන හඳුනාගෙන ඇති අතර, එම ආදර්ශ ගම්මානවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති ප්‍රමුඛතාගත කර ඇත. ශ්‍රී ලංකාවේ සියලුම සුභසාධන වැඩසටහන් සඳහා සුදුසු නීතිමය රාමුවක්

1 අභාවප්‍රාප්ත ආචාර්ය ඒ.එන්.එස්. කුලසිංහ මහතා අනුස්මරණය කිරීම සඳහා 2018 ජූලි මාසයේදී මොරගහකන්ද ජලාශය "කුලසිංහ ජලාශය" ලෙස නම් කරන ලදී.

**6.1 රූප සටහන**

**ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය අංශයේ පැතිකඩ - 2018 ජනවාරි - අගෝස්තු (රුපියල් බිලියන)**




මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සැපයීමටත්, විනිවිදභාවයෙන් යුතු තේරීම් ක්‍රියාවලියක් සකස් කිරීමත් සඳහා ස්ථාපිත කරන ලද සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සුභසාධන ප්‍රතිලාභ පනතෙහි ඵලදායී ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පනත යටතේ කෙටුම්පත් කරන ලද නීතිරීති 2018 වසරේදී අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂිතය. තවද, 2018 වසරේදී ඒකාබද්ධ සමාජ ආරක්ෂණ තොරතුරු ජාලය[2] සකස් කොට අවසන් කිරීමට අපේක්ෂිත අතර, මූලික වශයෙන් ප්‍රධාන සුභසාධන වැඩසටහන් හතර[3] සඳහා ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය කෙටුම්පත් කිරීමට අපේක්ෂිතය. මේ අතර, පොහොර සහනාධාර වැඩසටහන යටතේ මූල්‍යමය දීමනාවක් ලබා දීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ ගැටලු වළක්වා ගැනීම සඳහා එම මූල්‍යමය දීමනාව අවලංගු කරමින් ඒ වෙනුවට ගොවීන්ට පොහොර ලබා දීමට 2018 මාර්තු මසදී අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදී. ඒ අනුව, 2018 යල කන්නයේ සිට අනුමත පොහොර ප්‍රමාණය, වී සඳහා කිලෝග්‍රෑම් 50 ක පොහොර බෑගයක් රුපියල් 500 බැගින් සහ අනෙකුත් බෝග (අල, ළූනු, මිරිස්, ඉරිඟු සහ සෝයා) සඳහා කිලෝග්‍රෑම් 50 ක පොහොර බෑගයක් රුපියල් 1,500 බැගින් සහන මිලට ලබා දෙනු ලැබේ.

- මධ්‍යම රජයේ අයවැය මත පීඩනය අවම කිරීමේ අරමුණින් යුතුව රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට 2018 වසරේ පළමු මාස අට තුළදී ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. ඒ අනුව, 2017 මාර්තු මසදී ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කළ රජය සතු වාණිජ ව්‍යවසාය පහෙහි[4] 2017 වසරේ පළමු භාගය සඳහා වන කාර්යසාධන වාර්තා 2018 මැයි මස දී කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා රජය සතු තවත් වාණිජ ව්‍යවසාය දහයක් සමග ද ආයතනික අභිප්‍රාය ප්‍රකාශ අත්සන් කිරීමට අපේක්ෂිතය. නාගරික සංවර්ධන අධිකාරිය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය දැව සංස්ථාව, මිල්කෝ සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය, මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය, ලංකා සතොස ආයතනය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කැණීම් කාර්යාංශය සහ කුරුණෑගල වැවිලි සමාගම එම ආයතන වේ. තවද, ලංකා ඛනිජ තෙල් නීතිගත

2 විද්‍යුත් දත්ත ගබඩාවක් වන ඒකාබද්ධ සමාජ ආරක්ෂණ තොරතුරු ජාලය ප්‍රධාන වශයෙන් විවිධ සුබසාධන වැඩසටහන් සඳහා සුබසාධන ප්‍රතිලාභීන් තෝරා ගැනීම සහ ගෙවීම් සිදු කිරීම සඳහා සුබසාධන ප්‍රතිලාභීන්ගේ දත්ත ගබඩා කරනු ලබයි.

3 සමෘද්ධි වැඩසටහන, වයස අවුරුදු 70 ට වැඩි වැඩිහිටි පුද්ගලයන් සඳහා මූල්‍ය සහාය, ආබාධිත අඩු ආදායම්ලාභී පුද්ගලයන් සඳහා සහාය සහ වකුගඩු රෝගීන් සඳහා මූල්‍ය සහාය මෙම වැඩසටහන්වලට අයත් වේ.

4 ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම, ශ්‍රී ලංකා වරාය අධිකාරිය මෙයට අයත් වේ.

සංස්ථාවේ මූල්‍යමය ශක්‍යතාව වැඩිදියුණු කිරීමට සහ ඛනිජ තෙල් මිල තීරණය කිරීමේ ක්‍රියාවලියෙහි විනිවිදභාවය තහවුරු කිරීම සඳහා ඛනිජ තෙල් සඳහා ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමට 2018 මැයි මසදී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, ඛනිජ තෙල් මිල ගණන් ඒවායෙහි පිරිවැය හා සමගාමීව පවත්වාගෙන යාම සඳහා 2018 මැයි මස සිට සෑම මසකදීම මිල සූත්‍රය මත පදනම්ව මිල ගැලපීම් සිදු කරනු ලබයි. තවද, ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය කාර්යසාධනය සහ විනිවිදභාවය ඉහළ නැංවීම සඳහා 2018 වසර අවසානය වන විට විදුලි බලය සඳහා ද ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණයක් සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂිතය. ඒ අනුව, විදුලි බලය සඳහා ස්වයංක්‍රීය මිල යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් 2018 වසරේ මැයි මසදී තොග සැපයුම් කටයුතු පිළිබඳ ගනුදෙනු සටහන් කරන ගිණුමක් ස්ථාපිත කරන ලදී.

- **විචක්ෂණ ණය කළමනාකරණ උපායමාර්ගයක් ක්‍රියාත්මක කිරීම සඳහා සක්‍රීය වගකීම් කළමනාකරණ පනත නීතිගත කළ අතර, 2019 - 2023 කාලපරිච්ඡේදය සඳහා මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයක් සකස් කෙරෙමින් පවතී.** 2018 අංක 08 දරන සක්‍රීය වගකීම් කළමනාකරණ පනත මගින් රාජ්‍ය ණය කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කරන ලදී. මෙම පනත 2018 මාර්තු මාසයේ දී පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද අතර, රාජ්‍ය ණය වඩාත් පූර්වෝපායී ලෙස කළමනාකරණය කිරීමට එමගින් රජයට හැකියාව ලැබේ. ඒ අනුව, මෙම පනත මගින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර කල්පිරීමට ප්‍රථම ප්‍රතිමූල්‍යනය කිරීමේ අවශ්‍යතාවයෙන් කොටසක් සූදානම් කර ගැනීම, භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීම දීර්ඝ කිරීම හා භාණ්ඩාගාර බැඳුම්කර කූපන් ගෙවීම සුමට කිරීම සහ එමගින් අනාගත වාණිජ ණය වගකීම් කළමනාකරණය සඳහා වැඩි ඉඩක් ලබා දීම සහ රාජ්‍ය ණයෙහි අවදානම් තත්ත්වය කළමනාකරණය කිරීම සිදු වේ. රජයේ අයවැය අවශ්‍යතාවන් අවම පිරිවැයකින් මූල්‍යකරණය කිරීම හා ණය කළඹේ අවදානම විචක්ෂණශීලී මට්ටම්වල කළමනාකරණය කර ගැනීම සහතික කිරීම සඳහා ණය උපකරණයන්හි යෝග්‍ය සංයුතියක් ගොඩනැගීම කෙරෙහි මැදිකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය මගින් මූලික වශයෙන් අවධානය යොමු කරයි.

- **රජය විසින් දොළොස් වැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය 2018 අප්‍රේල් මාසයේදී සාර්ථක ලෙස නිකුත් කරන ලදී.** එ.ජ. ඩොලර් බිලියන 2.5 ක වටිනාකමකින් යුක්ත මෙම බැඳුම්කර නිකුතුව ශ්‍රී ලංකාවේ 2007 සිට නිකුත් කරන ලද විශාලතම අක්වෙරළ බැඳුම්කරය වේ. ඒ අනුව, සියයට 5.75 ක වාර්ෂික ඵලදා අනුපාතිකයක් යටතේ අවුරුදු 5 ක කල් පිරීමේ කාලයක් සහිතව සහ සියයට 6.75 ක වාර්ෂික ඵලදා අනුපාතිකයක් යටතේ අවුරුදු 10 ක කල්පිරීමේ කාලයක් සහිතව එ.ජ. ඩොලර් බිලියන 1.25 බැගින් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කරන ලදී. එයට අමතරව, එ.ජ. ඩොලර් බිලියන 1.0 ක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමක් 2018 ඔක්තෝබර් මාසයේ දී ලබා ගන්නා ලදී.

- **ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2018 වසරේ ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම්වල තත්ත්වය තහවුරු කරන ලදී.** වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය හා නිසි මුදල් ප්‍රතිපත්ති වැඩපිළිවෙළක් පවත්වාගෙන යෑම සැලකිල්ලට ගනිමින් 2018 පෙබරවාරි 06 දින ෆිච් (Fitch) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම “B +” සමඟ ඉදිරි දැක්ම “ස්ථාවර” ලෙස තහවුරු කරන ලදී. 2018 ජූලි 26 වන දින මූඩීස් (Moody's) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය ද ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම “B1”ලෙස සහ ඉදිරි දැක්ම “ඍණාත්මක” ලෙස තහවුරු කරන ලදී. මේ අතර, ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් (Standard and Poor's) ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය දිගුකාලීන ණය ශ්‍රේණිගත කිරීම “B +” සමඟ ඉදිරි දැක්ම “ස්ථාවර” ලෙස තහවුරු කරන ලදී. මෙමගින්, ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ස්ථායීතාව හා විදේශ විනිමය සංචිත ගොඩනැගීම ඇතුළත් සැලසුම්ගත ප්‍රතිසංස්කරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මෙන්ම ශ්‍රී ලංකාවට සමාන ණය ශ්‍රේණිගත කිරීමේ මට්ටමක් ඇති බොහොමයක් රටවලට සාපේක්ෂව මධ්‍යස්ථ ඒකපුද්ගල ආදායමක් හා ශක්තිමත් ආයතන පැවතීම පිළිබිඹු වේ.

6


## රජයේ අයවැය කටයුතු

### ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ

- **2018 වසරේ පළමු මාස අට තුළදී වර්තන ගිණුමේ හිඟය සුළු වශයෙන් ඉහළ ගියද, සමස්ත අයවැය හිඟයෙහි සහ ප්‍රාථමික ගිණුමේ ශේෂයෙහි යහපත් කාර්යසාධනයක් දක්නට ලැබුණි.** ආදායම් එක්රැස් කිරීම් අඩු මට්ටමක පැවති පසුබිමක වුවද, මුළු වියදම හා ශුද්ධ ණය දීම් පහළ යාම සමස්ත අයවැය හිඟයෙහි සහ ප්‍රාථමික ගිණුමේ ශේෂයෙහි යහපත් කාර්යසාධනය සඳහා දායක විය. ඒ අනුව, 2018 වසරේ පළමු මාස අට තුළදී, ඇස්තමේන්තුගත ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය හිඟය, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 4.0 සිට සියයට 3.5 දක්වා අඩු විය. එසේම නාමික වශයෙන් ගත් කළ, 2018 වසරේ පළමු මාස අට තුළදී සමස්ත අයවැය හිඟය රුපියල් බිලියන 520.2 සිට රුපියල් බිලියන 510.9 දක්වා අඩු විය. ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ පළමු මාස අට තුළදී ප්‍රාථමික ගිණුමේ ශේෂය (පොලී ගෙවීම් රහිත අයවැය හිඟය) සියයට 0.01 (රුපියල් බිලියන 1.6) ක හිඟයක් වාර්තා කළ අතර, සලකා බලන කාලපරිච්ඡේදයේදී එය සියයට 0.4 ක (රුපියල් බිලියන 57.6) ක අතිරික්තයක් විය. කෙසේ වුවද, 2018 පළමු මාස අට තුළදී රජයේ නිර්-ඉතුරුම් පිළිබිඹු කෙරෙන වර්තන ගිණුමේ හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.9 සිට ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 1.0 දක්වා වැඩි විය.

**6.2 රූප සටහන**

**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක**




මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## ආදායම සහ ප්‍රදාන

### ආදායම

- 2018 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තු අනුව, **රජයේ මුළු ආදායම 2018 වසරේ දී රුපියල් බිලියන 2,217.2 දක්වා සියයට 21.1 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.** රජයේ මුළු ආදායම ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන තත්ත්වයකදී 2018 වසරේ මුළු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 15.6 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති අතර, එය සියයට 14.3 ක බදු ආදායමකින් සහ සියයට 1.3 ක බදු නොවන ආදායමකින් සමන්විත වනු ඇත.

- **2018 වසරේ පළමු මාස අට තුළදී, රජයේ බදු ආදායම් රැස්කිරීමේ අඩු බව නිරූපනය කෙරෙමින් රජයේ ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 9.0 සිට සියයට 8.6 දක්වා අඩු විය.** කෙසේ වෙතත්, 2018 වසරේ පළමු මාස අට තුළදී රජයේ මුළු ආදායම නාමික වශයෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,172.4 සිට රුපියල් බිලියන 1,242.2 දක්වා සියයට 6.0 කින් ඉහළ ගියේය. රජයේ බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 8.4 සිට සියයට 7.8 දක්වා අඩු වූ අතර, එය නාමික වශයෙන් රුපියල් බිලියන 1,133.7 දක්වා සියයට 3.5 කින් වැඩි විය. මෙය, ආදායම් බදු, මෝටර් වාහන ආනයන මත වන නිෂ්පාදන බද්ද, දුම්කොළ හා සිගරට් මත වන සුරා බදු, එකතු කළ අගය මත බද්ද, වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සහ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම ඉහළ යෑමේ සහ ආනයන බදු, සෙස් බද්ද සහ ඛනිජ තෙල් නිෂ්පාදන මත වූ නිෂ්පාදන බදු මගින් ලද ආදායම අඩු වීමේ ශුද්ධ ප්‍රතිඵලයකි. බදු නොවන ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.6 සිට සියයට 0.7 දක්වා වැඩි වූ අතර, එය නාමික වශයෙන් රුපියල් බිලියන 108.6 දක්වා සියයට 40.2 කින් වැඩි විය. බදු නොවන ආදායම ඉහළ යෑම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු ලාභ පැවරුම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගෙන් ලද ලාභ හා ලාභාංශ සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම ගාස්තු හා අය

### 6.1 සංඛ්‍යා සටහන
### ආර්ථික වර්ගීකරණය අනුව රාජ්‍ය ආදායම

රු. බිලියන

| අයිතමය | 2016 | 2017 (අ) | 2018 අනුමත ඇස්තමේන්තු | 2017 ජන-අගෝ (අ) | 2018 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|---|
| බදු ආදායම | **1,463.7** | **1,670.2** | **2,034.0** | **1,094.9** | **1,133.7** |
| ආදායම් බදු | 258.9 | 274.6 | 370.0 | 171.0 | 195.9 |
| එකතුකළ අගය මත බදු | 283.5 | 443.8 | 550.0 | 290.0 | 304.8 |
| නිෂ්පාදන බදු | 455.0 | 469.5 | 535.0 | 312.5 | 335.2 |
| ආනයන මත බදු | 156.5 | 136.5 | 175.0 | 92.5 | 63.9 |
| වරාය සහ ගුවන් තොටුපළ බද්ද | 88.8 | 102.4 | 115.0 | 65.6 | 73.4 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 57.4 | 69.0 | 87.0 | 45.0 | 46.8 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 55.8 | 71.4 | 80.0 | 49.2 | 51.3 |
| සෙස් බද්ද | 61.7 | 59.6 | 49.5 | 39.5 | 35.0 |
| අනෙකුත් | 46.1 | 43.5 | 72.5 | 29.5 | 27.4 |
| බදු නොවන ආදායම | **222.4** | **161.4** | **183.2** | **77.4** | **108.6** |
| මුළු ආදායම | **1,686.1** | **1,831.5** | **2,217.2** | **1,172.4** | **1,242.2** |

(අ) තාවකාලික

මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

කිරීම්වලින් ලද ආදායම ඉහළ යෑම ද ප්‍රධාන වශයෙන් දායක විය. සමස්තයක් ලෙස, රුපියල් බිලියන 2,217.2 ක් වූ වාර්ෂික ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස මෙම කාලපරිච්ඡේදයේ මුළු ආදායම, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 58.3 හා සැසඳීමේදී සියයට 56.0 ක් විය. තවද, මෙම කාලපරිච්ඡේදයේදී සාමාන්‍ය මාසික ආදායම 2018 අයවැය මගින් ඇස්තමේන්තුගත කර ඇති රුපියල් බිලියන 184.8 ක් වූ සාමාන්‍ය මාසික ආදායම හා සැසඳීමේදී රුපියල් බිලියන 155.3 ක් පමණ විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී ආදායම් බදු මගින් ලද ආදායම රුපියල් බිලියන 195.9 දක්වා සියයට 14.6 කින් වැඩි වූ අතර, සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු, උපයන විට ගෙවීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තු මගින් ලද ආදායම ඉහළ යෑම එයට ප්‍රධාන වශයෙන් හේතු විය.** 2018 වසරේ පළමු මාස අට තුළදී ආදායම් බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 1.3 සිට සියයට 1.4 දක්වා ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළදී සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 81.2 සිට රුපියල් බිලියන 99.0 දක්වා සියයට 21.9 කින් නාමික වශයෙන් වැඩි වූ අතර, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත 2018 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු ගෙවීම් සහ බදු වාර්තා අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම එයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අතර, 2018 වසරේ පළමු මාස අට තුළදී උපයන විට ගෙවීමේ බදු ආදායම පසුගිය වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 22.4 සිට රුපියල් බිලියන 27.8 දක්වා වැඩි වූ අතර, ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ආරම්භ කිරීමත් සමග උපයන විට ගෙවීමේ බදු වාර්තා ඉදිරිපත් කිරීම හා බදු ගෙවීම සම්බන්ධ අධීක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම ඒ සඳහා මූලික වශයෙන් හේතු විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආර්ථික සේවා ගාස්තු ආදායම 2017 වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 31.2 සිට රුපියල් බිලියන 38.2 දක්වා වැඩි විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදයේදී රඳවා ගැනීමේ බදු ආදායම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයේදී පැවති රුපියල් බිලියන 30.9 සිට රුපියල් බිලියන 36.2 දක්වා සියයට 14.5 කින් අඩු වූ අතර, 2018 අප්‍රේල් 01 දින සිට භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර පොලී ආදායම මත රඳවා ගැනීමේ බදු ඉවත් කිරීම ඒ සඳහා හේතු විය.


- **2018 වසරේ පළමු මාස අට තුළදී එකතු කළ අගය මත බදු ආදායම නාමික වශයෙන් රුපියල් බිලියන 304.8 දක්වා සියයට 5.1 කින් ඉහළ ගියද එකතු කළ අගය මත බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 2.2 සිට 2018 වසරේ පළමු මාස අට තුළදී සියයට 2.1 දක්වා අඩු විය.** දේශීය ආර්ථික කටයුතු මත එකතු කළ අගය මත බදු ආදායම පසුගිය වසරේ පළමු මාස අට තුළදී පැවති රුපියල් බිලියන 181.4 සිට රුපියල් බිලියන 191.1 දක්වා සියයට 5.3 කින් වැඩි විය. ආනයන ආශ්‍රිත කටයුතු මත එකතු කළ අගය මත බදු ආදායම ද 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 108.6 හා සැසඳීමේදී රුපියල් බිලියන 113.7 දක්වා සියයට 4.6 කින් වැඩි විය. තවද, 2018 වසරේ පළමු මාස අට තුළදී එකතු කළ අගය මත බදු ආදායම මුළු බදු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 26.5 සිට සියයට 26.9 දක්වා වැඩි විය. කෙසේ වුවද, එකතු කළ අගය මත බදු ආදායම මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 24.7 සිට 2018 වසරේ මුල් මාස අට තුළදී සියයට 24.5 දක්වා සුළු වශයෙන් අඩු විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී නිෂ්පාදන/සුරා බදු ආදායම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට**

6

**6.3 රූප සටහන**

**රාජ්‍ය ආදායමේ සංයුතිය (2018 ජන. - අගෝ.)**




මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2.4 සිට සියයට 2.3 දක්වා අඩු විය. කෙසේ වෙතත්, නිෂ්පාදන/සුරා බදු ආදායම 2018 වසරේ පළමු මාස අට තුළදී නාමික වශයෙන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 312.5 හා සැසැඳීමේදී රුපියල් බිලියන 335.2 දක්වා සියයට 7.2 කින් වැඩි වූ අතර, ඛනිජ තෙල් නිෂ්පාදන මගින් ලද ආදායම අඩු වුවද මෝටර් වාහන, දුම්කොළ හා සිගරට් සහ මධ්‍යසාර මත නිෂ්පාදන/සුරා බදු ආදායම ඉහළ යෑම එම වැඩි වීමට හේතු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී මෝටර් වාහන ආනයන ඉහළ යෑම හේතුවෙන් මෝටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම සියයට 14.8 ක වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 148.6 ක් විය. ඒ අතර, දුම්කොළ හා සිගරට් මත සුරා බදු ආදායම ද පසුගිය වසර හා සැසැඳීමේදී රුපියල් බිලියන 60.6 දක්වා සියයට 11.0 කින් සැලකිය යුතු ලෙස වැඩි වූ අතර, 2017 නොවැම්බර් මාසයේදී සිගරට් මත වූ සුරා බදු ඉහළ නැංවීම එයට හේතු විය. මධ්‍යසාර මත වූ සුරා බදු ආදායම ද 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 73.7 හා සැසඳීමේදී රුපියල් බිලියන 75.3 දක්වා සියයට 2.3 කින් වැඩි විය. කෙසේ වෙතත්, 2018 වසරේ පළමු මාස අට තුළදී ඛනිජ තෙල් නිෂ්පාදන මත නිෂ්පාදන බදු ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 50.1 සිට රුපියල් බිලියන 45.0 දක්වා සියයට 10.3 කින් අඩු වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී ඩීසල් ආනයන අඩු වීම එයට හේතු විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී ආනයන බදු මගින් ලද ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති සියයට 0.7 සිට සියයට 0.4 දක්වා සැලකිය යුතු ලෙස අඩු වූ අතර, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 0.4 හි නොවෙනස්ව පැවතුණි.** නාමික වශයෙන්, ආනයන බදු ආදායම 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 92.5 හා සැසැඳීමේදී රුපියල් බිලියන 63.9 දක්වා සියයට 30.9 කින් සැලකිය යුතු ලෙස අඩු වූ අතර, පෙට්‍රල්, ඩීසල් සහ කිරි පිටි සඳහා අදාළ වන තීරු බදු අනුපාතික අඩු කිරීම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 49.2 සිට රුපියල් බිලියන 51.3 දක්වා සියයට 4.2 කින් වැඩි වූ අතර, එය දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීම සහ දේශීය ගොවි ප්‍රජාවගේ සුබසිද්ධිය ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් වෙළඳ ද්‍රව්‍ය කිහිපයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉහළ නැංවීමෙහි ප්‍රතිඵලයකි.

- **2018 වසරේ පළමු මාස අට තුළදී, ජාතිය ගොඩනැගීමේ බදු ආදායම සහ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු ආදායම නාමික වශයෙන් ඉහළ ගිය අතර, මෙම කාලපරිච්ඡේදයේදී සෙස් බදු මගින් ලද ආදායම අඩු විය.** ජාතිය ගොඩනැගීමේ බදු ආදායම නාමික වශයෙන් රුපියල් බිලියන 46.8 දක්වා සියයට 4.0 කින් වැඩි වූ අතර, දේශීය ආර්ථික කටයුතු මෙන්ම ආනයන ආශ්‍රිත කටයුතු ඉහළ යෑම එයට හේතු විය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදයේ දී ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.3 හි නොවෙනස්ව පැවතුණි. 2018 වසරේ පළමු මාස අට තුළදී දේශීය ආර්ථික කටයුතු මත ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රුපියල් බිලියන 33.9 දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය. ආනයන ආශ්‍රිත කටයුතු මත ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ද 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති රුපියල් බිලියන 12.4 සිට රුපියල් බිලියන 12.9 දක්වා සියයට 4.0 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළදී වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු ආදායම රුපියල් බිලියන 73.4 දක්වා සියයට 11.9 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, මෙම කාලපරිච්ඡේදයේ දී සෙස් බදු ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 39.5 සිට රුපියල් බිලියන 35.0 දක්වා සියයට 11.6 කින් අඩු වූ අතර, ආනයන

6

භාණ්ඩ කිහිපයක් මත අදාළ වූ තීරු බදු නොවන බදු ඉවත් කිරීමේ අරමුණින් 2018 අයවැය මගින් ආනයන භාණ්ඩ 253 ක් මත සෙස් බදු ඉවත් කිරීම එයට හේතු විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී බදු නොවන ආදායම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 0.6 සිට සියයට 0.7 දක්වා ඉහළ ගියේය.** බදු නොවන ආදායම නාමික වශයෙන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 77.4 සිට රුපියල් බිලියන 108.6 දක්වා සියයට 40.2 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම්, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ඉහළ ලාභ හා ලාභාංශ සහ ගාස්තු හා අය කිරීම් මගින් ලද ඉහළ ආදායම බදු නොවන ආදායමේ වැඩිවීම සඳහා විශාල වශයෙන් හේතු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරුම් රුපියල් බිලියන 14.2 ක් විය. එයට අමතරව, රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ලාභ සහ ලාභාංශ 2018 වසරේ පළමු මාස අට තුළදී 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 12.5 සිට රුපියල් බිලියන 19.8 දක්වා සියයට 58.9 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, අදාළ කාලපරිච්ඡේදයේ දී ගාස්තු හා අයකිරීම් මගින් ලද ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී පැවති රුපියල් බිලියන 41.6 සිට රුපියල් බිලියන 47.0 දක්වා සියයට 13.0 කින් ඉහළ ගිය අතර, 2018 අයවැය මගින් ගාස්තු හා අයකිරීම් ඉහළ නැංවීම ඒ සඳහා හේතු විය. තවද, සලකා බලන කාලපරිච්ඡේදයේදී සමාජ ආරක්ෂණ දායක මුදල් රුපියල් බිලියන 16.5 දක්වා සියයට 7.7 කින් ඉහළ ගියේය. 2018 වසරේ පළමු මාස අට තුළදී පොලී මගින් ලද බදු නොවන ආදායම රුපියල් බිලියන 5.4 දක්වා සියයට 27.9 කින් ඉහළ ගිය අතර, කුලී මගින් ලද බදු නොවන ආදායම රුපියල් බිලියන 2.2 දක්වා සියයට 12.3 කින් ඉහළ ගියේය.

## ප්‍රදාන

- **2018 වසර සඳහා වන රුපියල් බිලියන 10.0 ක වාර්ෂික ඇස්තමේන්තුගත ප්‍රදාන ප්‍රමාණයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළදී ලද විදේශීය ප්‍රදාන ප්‍රමාණය රුපියල් බිලියන 5.1 ක් විය.** කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස අට තුළදී ලද විදේශීය ප්‍රදාන 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 2.3 ට සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.

## වියදම සහ ශුද්ධ ණය දීම

- **2018 වසර සඳහා වන අයවැය ඇස්තමේන්තුව අනුව, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ පැවති සියයට 19.3 සිට සියයට 20.4 දක්වා ඉහළ යනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත.** 2017 වසරේදී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 14.5 ක් වූ පුනරාවර්තන වියදම, 2018 වසරේදී සියයට 15.2 දක්වා ඉහළ යනු ඇතැයි ද, ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ පැවති සියයට 4.8 සිට සියයට 5.3 දක්වා ඉහළ යනු ඇතැයි ද ඇස්තමේන්තු කර ඇත. නාමික වශයෙන් මුළු වියදම සහ ශුද්ධ ණය දීම් 2017 වසරේ පැවති රුපියල් බිලියන 2,573.1 සිට රුපියල් බිලියන 2,902.2 දක්වා සියයට 12.8 කින් වැඩි වනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. 2018 වසරේදී පුනරාවර්තන වියදම රුපියල් බිලියන 2,152.0 දක්වා සියයට 11.6 කින් ඉහළ යනු ඇතැයිද, ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් රුපියල් බිලියන 750.2 දක්වා සියයට 16.2 කින් ඉහළ යනු ඇතැයිද අපේක්ෂා කෙරෙයි.

- **2018 වසරේ පළමු මාස අට තුළදී, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් ඇස්තමේන්තුගත ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 13.0 සිට සියයට 12.1 දක්වා අඩු වූ අතර, පුනරාවර්තන වියදම් මෙන්ම ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම්ද අඩු වීම එයට හේතු විය.** කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස අට තුළදී, මුළු වියදම සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,694.9

### 6.2 සංඛ්‍යා සටහන
### ආර්ථික වර්ගීකරණය අනුව වියදම

රු. බිලියන


| අයිතමය | 2016 | 2017 (අ) | 2018 අනුමත ඇස්තමේන්තු | 2017 ජන-අගෝ (අ) | 2018 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,757.8** | **1,927.7** | **2,152.0** | **1,294.4** | **1,384.6** |
| එයින් වැටුප් හා වේතන | 576.5 | 588.5 | 630.0 | 392.5 | 425.3 |
| පොලී ගෙවීම් | 610.9 | 735.6 | 820.0 | 518.6 | 568.5 |
| විදේශීය | 126.7 | 164.9 | 170.0 | 97.6 | 117.1 |
| දේශීය | 484.2 | 570.6 | 650.0 | 421.0 | 451.3 |
| සමෘද්ධි දීමනා | 40.7 | 39.7 | 44.0 | 26.6 | 26.2 |
| විශ්‍රාම වැටුප් | 171.9 | 181.1 | 197.7 | 120.3 | 127.6 |
| පොහොර සහනාධාර | 27.8 | 30.4 | 32.0 | 16.8 | 13.3 |
| **ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම්** | **576.1** | **645.4** | **750.2** | **400.5** | **373.7** |
| **මුළු වියදම හා ශුද්ධ ණය දීම්** | **2,333.9** | **2,573.1** | **2,902.2** | **1,694.9** | **1,758.2** |

(අ) තාවකාලික

මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

6

**6.4 රූප සටහන**
**රාජ්‍ය වියදමේ සංයුතිය (2018 ජන. - අගෝ.)**




මූලය: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

සිට රුපියල් බිලියන 1,758.2 දක්වා සියයට 3.7 කින් වැඩි විය. 2018 වසරේ පළමු මාස අට තුළදී මුළු වියදම සහ ශුද්ධ ණය දීම් වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 60.6 ක් වූ අතර, එය 2017 වසරේ පළමු මාස අට තුළදී සියයට 64.1 ක් විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී, පුනරාවර්තන වියදම ඇස්තමේන්තුගත ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති සියයට 10.0 සිට සියයට 9.5 දක්වා අඩු වූ අතර, සහනාධාර හා වර්තන පැවරුම් සහ වැටුප් හා වේතන මත වියදම අඩුවීම එයට හේතු විය.** කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස අට තුළදී, පුනරාවර්තන වියදම නාමික වශයෙන් 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 1,294.4 සිට රුපියල් බිලියන 1,384.6 දක්වා සියයට 7.0 කින් වැඩි විය. 2018 වසරේ පළමු මාස අට තුළදී නාමික වශයෙන් පොලී ගෙවීම් සඳහා වන වියදම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 518.6 සිට රුපියල් බිලියන 568.5 දක්වා සියයට 9.6 කින් වැඩි විය. ජාත්‍යන්තර පොලී අනුපාතික සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. පොලී අනුපාතික ඉහළ යෑම විචල්‍ය පොලී අනුපාතික යටතේ ලබා ගත් ණය සඳහා වන පොලී ගෙවීම් කෙරෙහි අයහපත් බලපෑම් ඇති කරනු ලබයි. මීට අමතරව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වැනි නොපියවූ වාණිජ ණය ප්‍රමාණය ඉහළ යෑමෙන් රජයේ ණය ප්‍රමාණය ඉහළ යෑම පොලී වියදම් ඉහළ යෑම කෙරෙහි හේතු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී වැටුප් හා වේතන වියදම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 3.0 සිට සියයට 2.9 දක්වා අඩු වුවද, වැටුප් හා වේතන වියදම නාමික වශයෙන්, රුපියල් බිලියන 425.3 දක්වා සියයට 8.3 කින් වැඩි විය. තවද, සහනාධාර සහ වර්තන පැවරුම් සඳහා වන වියදම ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 2.2 සිට සියයට 2.1 දක්වා අඩු වූ අතර, පොහොර සහනාධාරය, විශ්‍රාම වැටුප් ගෙවීම්, රාජ්‍ය සංස්ථාවලට කරන ලද පැවරුම් සහ සමෘද්ධි වැඩසටහන මත වන වියදම අඩු වීම මේ සඳහා හේතු විය. කෙසේ වුවද, සහනාධාර සහ වර්තන පැවරුම් මත වන වියදම නාමික වශයෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 291.2 සිට රුපියල් බිලියන 306.3 දක්වා සියයට 5.2 කින් වැඩි විය. විශ්‍රාම වැටුප් ගෙවීම්ද රුපියල් බිලියන 127.6 දක්වා සියයට 6.1 කින් වැඩි වූ අතර, මෙම කාලපරිච්ඡේදය තුළදී විශ්‍රාමිකයන් සංඛ්‍යාව ඉහළ යාම ඒ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

- **2018 වසරේ පළමු මාස අට තුළදී, ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද අඩු විය.** ඒ අනුව, 2018 වසරේ පළමු මාස අට තුළදී ප්‍රාග්ධන වියදම සහ ශුද්ධ ණය දීම් ඇස්තමේන්තුගත ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ පැවති සියයට 3.1 සිට සියයට 2.6 දක්වා අඩු වූ අතර, එය නාමික වශයෙන් රුපියල් බිලියන 373.7 දක්වා සියයට 6.7 කින් අඩු විය. 2018 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් වාර්ෂික ඇස්තමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ සියයට 57.3 හා සැසඳීමේදී සියයට 49.8 ක් විය.

## අයවැය හිඟය මූල්‍යනය කිරීම

- **2018 වසරේ පළමු මාස අට තුළදී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් විදේශීය මූලාශ්‍ර යොදා ගන්නා ලදී.** ඒ අනුව, ශුද්ධ විදේශීය මූල්‍යනය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පැවති රුපියල් බිලියන 246.7 සිට රුපියල් බිලියන 271.3 දක්වා වැඩි විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදයේදී ශුද්ධ දේශීය මූල්‍යනය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී පැවති රුපියල් බිලියන 273.5 සිට රුපියල් බිලියන 239.5 දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.

6

### 6.3 සංඛ්‍යා සටහන
### ණය ලබාගැනීමේ මූලාශ්‍ර

රු. බිලියන

| අයිතමය | 2016 | 2017 (අ) | 2017 ජන-අගෝ (අ) | 2018 ජන-අගෝ (අ) |
|---|---|---|---|---|
| **දේශීය මූල්‍යනය** | **248.4** | **294.3** | **273.5** | **239.5** |
| බැංකු | 140.0 | 187.7 | 236.5 | 28.6 |
| බැංකු නොවන | 108.5 | 106.5 | 37.0 | 210.9 |
| **විදේශීය මූල්‍යනය** | **391.9** | **439.2** | **246.7** | **271.3** |
| ණය | 109.3 | 0.8 | 15.1 | -10.8 |
| වාණිජ ණය | 319.7 | 381.2 | 224.6 | 321.0 |
| භාණ්ඩාගාර බැඳුම්කරවල විදේශීය ආයෝජන | -44.3 | 43.7 | 7.1 | -34.2 |
| භාණ්ඩාගාර බිල්පත්වල විදේශීය ආයෝජන | 7.2 | 13.6 | ... | -4.7 |
| **සමස්ත මූල්‍යනය** | **640.3** | **733.5** | **520.2** | **510.9** |

(අ) තාවකාලික


මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

- **අයවැය හිඟය දේශීය මූලාශ්‍ර මගින් මූල්‍යනය කිරීමේදී ප්‍රධාන වශයෙන් බැංකු නොවන අංශය මත රඳා පැවති අතර, බැංකු අංශය මත පැවති රැඳියාව සැලකිය යුතු ලෙස අඩු විය.** ඒ අනුව, බැංකු නොවන අංශයෙන් සිදු කළ ශුද්ධ දේශීය මූල්‍යනය 2017 අදාළ කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 37.0 සිට රුපියල් බිලියන 210.9 දක්වා සැලකිය යුතු ලෙස වැඩි විය. හම්බන්තොට වරාය රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට විදේශීය ආයෝජකයෙකු සමඟ 2017 වසරේදී අත්සන් කරන ලද අනුග්‍රාහක ගිවිසුම තුළින් ලද රුපියල් බිලියන 41.3 ක් වූ පැවරීමෙන් ලත් මුදල් ද මෙයට ඇතුළත් වේ. 2018 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය 2017 අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රුපියල් බිලියන 236.5 සිට රුපියල් බිලියන 28.6 දක්වා අඩු විය. භාණ්ඩාගාර බිල්පත් හරහා සිදු කළ මූල්‍යනය අඩුවීම සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර යටතේ ලබා ගත් ණය ආපසු ගෙවීම හේතුවෙන් වාණිජ බැංකුවලින් සිදු කරන ලද මූල්‍යනය සැලකිය යුතු ලෙස අඩු වීම, බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය අඩුවීම සඳහා හේතු විය. කෙසේ වුවද, 2018 වසරේ පළමු මාස අට තුළදී මහ බැංකුවෙන් සිදු කරන ලද මූල්‍යනය 2017 වසරේ පළමු මාස අට තුළදී වාර්තා වූ රුපියල් බිලියන 119.5 ක ආපසු ගෙවීමට සාපේක්ෂව රුපියල් බිලියන 20.7 දක්වා වැඩි විය.

- **සලකා බලන කාලපරිච්ඡේදයේදී, දේශීය ණය ගැනීම් ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වැනි ණය උපකරණ මාර්ගයෙන් සිදු කෙරිණි.** 2018 වසරේ පළමු මාස අට තුළදී භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයේ පැවති රුපියල් බිලියන 7.4 සිට රුපියල් බිලියන 81.5 දක්වා වැඩි විය. 2018 වසරේ පළමු මාස අට තුළදී භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය 2017 වසරේ පැවති රුපියල් බිලියන 48.7 සිට රුපියල් බිලියන 157.8 දක්වා වැඩි විය. සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මගින් සිදු කළ මූල්‍යනය 2017 වසරේ පළමු මාස අට තුළ පැවති රුපියල් බිලියන 53.3 හා සසඳන කල රුපියල් බිලියන 81.6 ක ශුද්ධ ආපසු ගෙවීමක් වාර්තා කළේය.

- **ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළදී විදේශීය මූල්‍යනය සැලකිය යුතු ලෙස වැඩි විය.** 2018 වසරේ පළමු මාස අට තුළදී, අයවැය හිඟය මූල්‍යනය සඳහා වන විදේශීය ණය ගැනීම් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ රුපියල් බිලියන 246.7 සිට රුපියල් බිලියන 271.3 දක්වා වැඩි විය. ශුද්ධ විදේශීය මූල්‍යනය, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මගින් ලබාගත් ණය සහ විදේශ ව්‍යාපෘති ණය, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් හා භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ විදේශීය ආයෝජනවලට අදාළව ශුද්ධ ණය ආපසු ගෙවීම් වලින් සමන්විත වේ.

### 6.5 රූප සටහන
### අයවැය හිඟය මූල්‍යනය




මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## රාජ්‍ය ණය සහ ණය සේවාකරණ ගෙවීම්


### රාජ්‍ය ණය

- **මධ්‍යම රජයේ නොපියවූ ණය ප්‍රමාණය 2018 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට රුපියල් බිලියන 11,052.0 දක්වා රුපියල් බිලියන 739.0 කින් වැඩි විය.** ඒ අනුව, පළමු මාස අට තුළදී දේශීය ණය රුපියල් බිලියන 5,776.3 දක්වා රුපියල් බිලියන 181.9 කින් වැඩි වූ අතර, විදේශීය ණය රුපියල් බිලියන 5,275.7 දක්වා රුපියල් බිලියන 557.1 කින් වැඩි විය. සාපේක්ෂව ඉහළ අයවැය හිඟය සහ ශ්‍රී ලංකා රුපියල අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව අවප්‍රමාණය වීම, නොපියවූ ණය ප්‍රමාණය රුපියල් පදනමින් වැඩි වීම සඳහා දායක විය.

- **සමස්ත දේශීය ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස කෙටිකාලීන ණය ප්‍රමාණය සුළු වශයෙන් ඉහළ ගිය අතර, සමස්ත දේශීය ණය ප්‍රමාණයෙහි ප්‍රතිශතයක් ලෙස මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණය අඩු විය.** 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත දේශීය ණයවලින් කෙටිකාලීන ණය ප්‍රමාණය 2017 වසර අවසානයේ පැවති සියයට 18.4 සිට සියයට 19.4 දක්වා වැඩි විය. මෙයට ප්‍රතිවිරුද්ධව, සමස්ත දේශීය ණයවලින් මැදි හා දිගුකාලීන ණය ප්‍රමාණය 2017 වසර අවසානය වන විට පැවති සියයට 81.6 සිට 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 80.6 දක්වා සුළු වශයෙන් අඩු විය. බැංකු අංශය සතු භාණ්ඩාගාර බිල්පත්වල ප්‍රමාණය වැඩි වීම හේතුවෙන් සමස්ත දේශීය ණයවලින් භාණ්ඩාගාර බිල්පත් මාර්ගයෙන් ලබා ගත් ණය ප්‍රමාණය 2017 වසර අවසානයේදී පැවති සියයට 12.5 සිට 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 13.4 දක්වා වැඩි විය. කෙසේ වෙතත්, නොපියවූ දේශීය ණය සඳහා වැඩිම දායකත්වය සපයන භාණ්ඩාගාර බැඳුම්කර මාර්ගයෙන් ලබා ගත් ණය ප්‍රමාණය සමස්ත දේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස 2017 වසර අවසානයට පැවති සියයට 68.3 ට සාපේක්ෂව 2018 වසරේ අගෝස්තු මස අවසානයට සියයට 68.0 දක්වා සුළු වශයෙන් අඩු විය. තවද, සලකා බලන කාලපරිච්ඡේදයේදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීමට සාපේක්ෂව ඒවා වැඩි ප්‍රමාණයක් පරිණත වීම හේතුවෙන් සමස්ත දේශීය ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ප්‍රමාණය 2017 වසර අවසානයට පැවති සියයට 11.4 ට සාපේක්ෂව 2018 වසරේ අගෝස්තු අවසානය වන විට සියයට 10.2 දක්වා අඩු විය.

**6.6 රූප සටහන**

**මධ්‍යම රජයේ නොපියවූ ණය**




මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

**6.4 සංඛ්‍යා සටහන**

**මධ්‍යම රජයේ නොපියවූ ණය**

රු. බිලියන

| අයිතමය | 2016 | 2017 (අ) | 2017 අගෝස්තු අවසානයට (අ) | 2018 අගෝස්තු අවසානයට (අ) |
|---|---|---|---|---|
| **දේශීය ණය (ආ)** | **5,341.5** | **5,594.4** | **5,659.4** | **5,776.3** |
| කල්පිරීම අනුව | | | | |
| කෙටිකාලීන | 968.4 | 1,031.2 | 1,135.0 | 1,117.8 |
| මැදි හා දිගුකාලීන | 4,373.1 | 4,563.2 | 4,524.4 | 4,658.6 |
| ආයතන අනුව | | | | |
| බැංකු | 2,114.9 | 2,328.5 | 2,605.2 | 2,422.3 |
| බැංකු නොවන අංශය | 3,226.6 | 3,265.9 | 3,054.3 | 3,354.0 |
| **විදේශීය ණය (ඇ)** | **4,045.8** | **4,718.6** | **4,626.5** | **5,275.7** |
| සහනදායී | 1,897.7 | 2,130.5 | 2,061.0 | 2,197.5 |
| සහනදායී නොවන | 2,148.1 | 2,588.1 | 2,565.5 | 3,078.2 |
| **රජයේ මුළු ණය** | **9,387.3** | **10,313.0** | **10,285.9** | **11,052.0** |

මූලයන්: මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) (i) විදේශීය ආයෝජකයින්ට නිකුත් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් නොවේ.
(ii) රාජ්‍ය ආයතන මගින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ණය පිය වීම සඳහා 2012 දී නිකුත් කළ රු. මිලියන 78,447 ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළත් නොවේ. 2017 ජනවාරි මාසයේ දී ඒවායින් සමහර බැඳුම්කර කල්පිරීම නිසා 2017 ජනවාරි සිට නොපිය වූ ණය ප්‍රමාණය රුපියල් මිලියන 56,662 කි.

(ඇ) රුපියල් වටිනාකමකින් යුතු භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කරවල සිදු කළ විදේශ ආයෝජනවල නොපියවූ ප්‍රමාණය ඇතුළත් වේ.

- **විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කළ නොපියවූ දේශීය ණය ප්‍රමාණය 2017 වසර අවසානයේ පැවති රුපියල් බිලියන 702.1 (එ.ජ.ඩොලර් මිලියන 4,593.2) සිට 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 690.5 ක් දක්වා (එ.ජ.ඩොලර් මිලියන 4,517.8) සුළු වශයෙන් අඩු විය.** ඒ අනුව, 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 590.4 ක් (එ.ජ.ඩොලර් මිලියන 3,862.8) ක් වූ අතර, අක්වෙරළ බැංකු ඒකකවලින් ලබා

6


ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 100.1 (එ.ජ.ඩොලර් 655.0) ක් විය. සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් විදේශ ව්‍යවහාර මුදලින් වටිනාකම තක්සේරු කළ දේශීය ණය ප්‍රමාණය, 2017 වසර අවසානයේදී පැවති සියයට 12.6 සිට 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 12.0 දක්වා අඩු විය. මේ අතර, රුපියල්වලින් වටිනාකම තක්සේරු කළ දේශීය ණය ප්‍රමාණය 2018 අගෝස්තු මස අවසානය වන විට රුපියල් බිලියන 5,085.9 දක්වා රුපියල් බිලියන 193.5 කින් වැඩි විය.

- **සහනදායී නොවන ණය සමස්ත විදේශීය ණයවලට දක්වන අනුපාතය, 2017 වසර අවසානයේදී පැවති සියයට 54.8 සිට 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සියයට 58.3 දක්වා වැඩි විය.** ඒ අනුව, 2018 වසරේ අගෝස්තු මස අවසානය වන විට සමස්ත දේශීය ණය ප්‍රමාණයෙන් සහනදායී ණයවල අනුපාතය 2017 වසර අවසානයේ දී වූ සියයට 45.2 සිට සියයට 41.7 දක්වා අඩු විය. සහනදායී නොවන ණය රුපියල් බිලියන 3,078.2 දක්වා සියයට 18.9 කින් වැඩි වූ අතර, 2018 අප්‍රේල් මාසයේ දී එ.ජ.ඩොලර් බිලියන 2.5 ක වටිනාකමකින් යුත් දොලොස් වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

## ණය සේවාකරණ ගෙවීම්

- **2018 වසරේ පළමු මාස අට තුළදී සමස්ත දේශීය හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 1,511.8 ක් විය.** මෙම සමස්ත ණය සේවාකරණ ගෙවීම් රුපියල් බිලියන 943.3 (සියයට 62.4) ක ණය ආපසු ගෙවීම් හා රුපියල් බිලියන 568.5 (සියයට 37.6) ක පොලී ගෙවීම්වලින් සමන්විත විය. තවද, දේශීය හා විදේශීය ණය සේවාකරණ ගෙවීම් පිළිවෙළින් රුපියල් බිලියන 1,180.2 ක් හා රුපියල් බිලියන 331.6 ක් විය. 2018 වසරේ අගෝස්තු මස දක්වා වූ සමස්ත ණය සේවාකරණ ගෙවීම් ප්‍රමාණය මූලික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 76.7 ක් විය.

**6.7 රූප සටහන**
**රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් සහ රජයේ ආදායම්**




මූලයන් : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

## අපේක්ෂිත වර්ධනයන්

- **රජයේ සහ අනෙකුත් පාර්ශවයන්ගේ දැඩි කැපවීමකින් තොරව 2020 වසර වන විට අයවැය හිඟය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 3.5 දක්වා අඩු කර ගැනීම සහ 2021 වසර වන විට රාජ්‍ය ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 69 දක්වා අඩු කර ගැනීම වැනි මැදිකාලීන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම අතිශයින්ම අභියෝගාත්මක වනු ඇත.** පවත්නා නවතම තොරතුරුවලට අනුව, ආනයන බදු හා සෙස් බදු මගින් ලද ආදායම අඩු වීම සහ 2018 අයවැය මගින් හඳුන්වා දුන් ආදායම් යෝජනා ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීම හේතුවෙන් 2018 වසර සඳහා අපේක්ෂිත ආදායම මූලික ඇස්තමේන්තුවලට වඩා අඩු වනු ඇත. තවද, ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් සැලකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් 2018 වසර සඳහා වන මුළු වියදම හා ශුද්ධ ණය දීම් ද මූලික ඇස්තමේන්තුවලට වඩා අඩු වනු ඇත. රජයේ වියදම අඩු වීම මධ්‍යයෙහි වුවද, ආදායම් ඒකරාශීකරණය අඩු වීම හේතුවෙන් අයවැය හිඟය ඉහළ යනු ඇත. මේ අතර, ශුද්ධ මූල්‍යනය ඉහළ යෑම, ප්‍රධාන විදේශීය ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම සහ ද.දේ.නි.යෙහි නාමික වර්ධනය අඩු වීම හේතුවෙන් 2018 වසර අවසානයේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ඉහළ යනු ඇත. රාජ්‍ය ආයෝජන කපා හැරීම හෝ ප්‍රමාද කිරීම ආර්ථික වර්ධනය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බැවින්, රජයේ ආදායම සැලකිය යුතු ලෙස ඉහළ නංවා ගත හැකි ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. තවද, මැදිකාලීන රාජ්‍ය මූල්‍ය ඉලක්ක ළඟා කර ගැනීම සඳහා රජයේ දැඩි කැපවීම අඛණ්ඩව පවත්වාගෙන යාම, විශේෂයෙන්ම සැලසුම් කරන ලද ප්‍රතිසංස්කරණ කඩිනමින් ක්‍රියාවට නැංවීමේ අවශ්‍යතාව මෙම අභියෝග තුළින් පෙන්නුම් කෙරෙයි.